# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| දිනය | : | 2022.05.24 |
| වේලාව | : | පෙ.ව.9.30 |
| ස්ථානය | : | ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව |
| මූලාසනය | : | ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය (ප්‍රධාන ලේකම්) |

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප)<br>වැ.බ.ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය(බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය(බ.ප) |
| 04) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප) |
| 05) | සිරිසෝම ලොකුවිතාන මහතා | - | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප) |
| 06) | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප) |
| 07) | ගාමිණී ධර්මසේන මහතා | - | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය(බ.ප) |
| 08) | ඩබ්ලිව්.එම්.දයාවතී මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 09) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 10) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 11) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 12) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 13) | ඒ.තලංගම මයා | - | මූලස්ථාන ඉංජිනේරු |
| 14) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 15) | පේෂලා අබේසූරිය මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රධාන ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | අමාත්‍යාංශවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | නව ව්‍යාපෘති ආරම්භ කිරීම මේ වන විටත් නතර කර ඇති අතර 2021. වසරේ ඉතිරිව තිබූ අතැති බිල් රුපියල් මිලියන 611 කින් රුපියල් මිලියන 40ක් මේ වන විට ගෙවා අවසන් කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ලබා දී ඇති ප්‍රතිපාදන වලින් අතැති බිල් ගෙවීම් නොකරන ලෙස භාණ්ඩාගාරයෙන් දැනුම් දී ඇතත් ඉදිරියේදී භාණ්ඩාගාරයෙන් ඒ සදහා මුදල් ලැබීමේ අවදානමක් පවතින බැවින් අතැති බිල් සඳහා මුදල් ගෙවා අවසන් කිරීම සුදුසු බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>තවද සියලුම ව්‍යාපෘති සිදු කිරීම දැනට නවතා ඇති අතර ඉදිරියේදී යම් ආකාරයකින් ප්‍රතිපාදන ලැබුණහොත් ක්‍රියාත්මක කල හැකි පරිදි ව්‍යාපෘති අත්හිටුවීමට කටයුතු කරන ලෙසද , අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල හදිසි හා අත්‍යාවශ්‍යම කටයුතු පමණක් පවතින ප්‍රතිපාදන මත සිදු කිරීමට කටයුතු කරන ලෙසද ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.එමෙන්ම රටේ පවතින වාතාවරණය මත කෘෂිකර්ම ක්ෂේත්‍රය කෙරෙහිද විශේෂ අවධානය යොමුකර ඒ සදහා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිලධාරීන් විධිමත් පරිදි මෙහෙයවීමට ක්‍රියාකල යුතු බව වැඩි දුරටත් අවධාරණය කරන ලදී.<br><br>එමෙන්ම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙතින් ඉදිරිපත් වී ඇති ඉල්ලීම් සැලකිල්ලට ගෙන පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මගින් ලැබුණු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීමට ඇති අතැති බිල්පත් පළාත් සංවර්ධන ප්‍රදාන මගින් ලැබුණු ප්‍රතිපාදන වලින් ගෙවීමට හා භාණ්ඩාගාරයේ මුදල් ලැබුණු පසු එය පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වලට පරිවර්තනය කිරීමටත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය / සැලසුම්) ගෙන් ඉදිරිපත් වූ කරුණු සලකා බලා තීරණය කරන ලදී. එමෙන්ම ගෙවීම් කිරීම සඳහා අඩු අතැති බිල් ප්‍රමාණයක් ඇති අමාත්‍යාංශවල පළාත් සංවර්ධන ප්‍රදාන වලින් ලැබුණු ප්‍රතිපාදන ඉතිරියක් පවතීනම් එම මුදල් වලින් අත ඉතිරි බිල්පත් ඉතිරිව ඇති වෙනත් අමාත්‍යාංශයක බිල්පත් ගෙවීම සැලසුම් අංශය මගින් කටයුතු කිරීම සුදුසු බවටත් වැඩි දුරටත් සාකච්ඡා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය / සැලසුම් / ඉංජිනේරු)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 02. | කාර්යාල කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධව | යෝජිත මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර එහි අපේක්ෂිත අරමුණ වූයේ එම දත්ත භාවිතා කර කළමනාකරණ තීරණ නිශ්චිත නිගමනයන්ට එළඹිය හැකිවන පරිදි සමස්ත පද්ධතියක් සකස්කර ගැනීම බවද, ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් මේ සම්බන්ධව පවත්වන ලද රැස්වීමේදී එළඹි තීරණයට අනුව පළමු අදියර වශයෙන් එක් එක් ආයතන මට්ටමින් දත්ත අතුලත් කර අවශ්‍ය මූලික තොරතුරු ලබා ගැනීම සඳහා විමසුම් (Query) සකස් කර පරිශීලන අතුරු මුහුණතක් (Dashboard interface) සකස් කර අවසන් කිරීමට තීරණය කරන ලදී.<br>ඒ අනුව දැනට කර්නල් රසික කහඳගමගේ මහතා සමඟ පවතින ගිවිසුමේ කොන්දේසි ( terms of reference )සංශෝධනය විය යුතු බව තිරණය විය.<br>එසේම, දෙවන අදියර වශයෙන් අපේක්ෂිත ඉලක්කයට ළඟාවිය හැකිවන පරිදි සමස්ත තොරතුරු පද්ධතියක් සකස්කර ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකර සුදුසු ආයතනයක් තෝරා ගැනීම කල යුතු බව ද තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 03. | විදුලිය හා ඉන්ධන පරිභෝජනය අවම කිරීම | පළාත් සභා ගොඩනැගිල්ලෙහි විදුලිය හා ඉන්ධන පරිභෝජනය අවම කිරීම සඳහා සියලුම ආයතන දිනක් හෝ දෙකක් වසා තැබීම සුදුසු බවත්, කිහිප දෙනෙකු හෝ සේවයේ නිරත වන්නේ නම් වායුසමීකරණ හා විදුලිය ලබා දීම වෙනුවෙන් සාමාන්‍ය පරිදි ඉන්ධන වැය කිරීමට සිදුවන බවත් මූලස්ථාන ඉංජිනේරු විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඉන්ධන පරිභෝජනය අවම කිරීම හා විදුලිබල භාවිතය කළමනාකරණය සඳහා කාර්යාල වසා තැබීම පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් ඉදිරියේදී නිකුත් කිරීමට නියමිත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම සුදුසු බව තීරණය විය.<br>තවද සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවත්වාගෙන යනු ලබන කොවිඩ් ඒකකයට අනුබද්ධ පොලිස් නිලධාරීන් සෑම දිනකම එහි රැඳී සිටින බැවින් අඛණ්ඩව විදුලිය ලබා දීමට සිදුවීමේ ගැටළුවක් පවතින බව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව මේවන විට කොවිඩ් 19 වසංගත තත්ත්වය පාලනය වීමක් සිදුව ඇති බැවින් දිනපතා එහි රැඳී සිටීම අනවශ්‍ය බව එම පොලිස් නිලධාරීන්ට දැනුම් දී සතියට දින තුනක් පමණ පැමිණ අදාළ රාජකාරි කටයුතු යාවත්කාලීන කිරීම ප්‍රමාණවත් නොවන්නේද යන්න ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම සුදුසු බවද සාකච්ඡා කරන ලදී. | ආණ්ඩුකාර ලේකම්<br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 04. | ධාවනයෙන් ඉවත් කරන ලද වාහන අලුත් වැඩියාව සම්බන්ධව | අමාත්‍යාංශ මඟින් භාවිතයෙන් දැනට ඉවත් කර ඇති වාහන දෙකක් අලුත් වැඩියාකර භාවිතයට යොදා ගැනීමට මොරටුව මහ නගර සභාවෙන් ඉල්ලීම් ලැබී ඇති බැවින් අමාත්‍යාංශ මඟින් භාවිතයෙන් ඉවත් කරන ලද වාහන ලයිස්තුවෙන් සුදුසු වාහන දෙකක් තෝරා මොරටුව මහ නගර සභාවට ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | අදාල වාහන භාර අමාත්‍යාංශ ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| නව යෝජනා | | | |
| 05. | බස්නාහිර පළාත් ගෙවතු වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | ඉදිරියේදී ශ්‍රී ලංකාව මෙන්ම සමස්ත ලෝකයටම බලපාන ආහාර අර්බුදයට සාර්ථකව මුහුණ දීම සඳහා සූදානම් වීමේ අවශ්‍යතාවය පිළිබඳ ප්‍රධාන ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>බස්නාහිර පළාත් වගා සංග්‍රාමයේ කටයුතු කෘෂිකර්ම ලේකම්ගේ සහයෝගය ලබාගෙන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) හා සැලසුම් අධ්‍යක්ෂ විසින් සිදුකරන ලෙස ප්‍රධාන ලේකම් උපදෙස් ලබාදුන් අතර බස්නාහිර පළාත් වගා සංග්‍රාමයේ සැලැස්ම සකස් කරන ලෙස අධ්‍යක්ෂ සැලසුම් වෙත උපදෙස් ලබා දෙන ලදී.<br>හෝමගම ගබඩාවත්ත කෘෂිකර්ම අමාත්‍යාංශ ඉඩම, ප්‍රධාන ලේකම් සතු කොරතොට ප්‍රදේශයේ පිහිටි නිවාස සංකීර්ණයක් ඉදි කිරිමට යෝජිත ඉඩම වගා කිරිමටද සාකච්ඡා කරන ලදී.ඒ අනුව “මිහි ලක් වගා සංග්‍රාමය” නමින් වැඩසටහන ක්‍රියාත්මක කිරිමට සුදුසු බව යෝජනා විය. ඒ සඳහා ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරිමට ඉදිරි සතිය තුලදී ප්‍රධාන ලේකම් සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු සම්බන්ධීකරණය කර අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.<br>වල්පිට පිහිටි පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ බහුවිධ කෘෂි සැකසුම් මධ්‍යස්ථානයේ පළතුරු ජෑම් හා කෝඩියල් නිෂ්පාදන ඉතා උසස් තත්ත්වයක පවතින බව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් පවසන ලදී.<br>එම නිෂ්පාදන පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි කෘෂිකර්ම අමාත්‍යාංශයේ වී ග්‍රීන් අලෙවි සැලට හා වෙනත් වෙළඳ ආයතන වෙත යොමු කිරීම සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සුභ සාධක සංගමය මඟින් දැනට පළාත් සභා ගොඩනැගිල්ලේ පවත්වා ගෙන යනු ලබන වී ග්‍රීන් වෙළඳ සැලේ වර්තමාන තත්ත්වය සම්බන්ධව සෑහීමකට පත්විය නොහැකි බැවින් මෙම ගොඩනැගිල්ලේ සේවය කරන නිලධාරින් සඳහා උපරිම සේවයක් සැපයීම අරමුණු කර ගනිමින් මෙම වෙළඳ සැල කෘෂි සේවා අධිකාරියට පවත්වා ගෙන යාම සඳහා පැවරීමට සුදුසු බව යෝජනා වු අතර ඒ අනුව ඉදිරි කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 06. | ඇප අඟා පණතට අනුව අදාල නිලධාරීන් සඳහා ඇප තැන්පත් කිරීම සම්බන්ධව | ඇප අඟා පණත ප්‍රකාරව පළාත් මුල්‍ය රීති "ඊ 549" හි සඳහන් කර ඇති ඇප තැබීම් මාර්ග වලින් උචිත ක්‍රමයක් තෝරා ගෙන ඇප තැන්පත් කිරීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර ප්‍රධාන ලේකම් විසින් ඇප රක්ෂණ ආයතනයක් ප්‍රසම්පාදනය මඟින් තෝරාදීම අවශ්‍ය නොවන බව තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා ආයතන ප්‍රධානීන් |
| 07. | නිවාඩුදින වැටුප් හා අතිකාල ඉල්ලුම් කිරීම සම්බන්ධව | වියදම් කළමනාකරණ චක්‍රලේඛය මඟින් අතිකාල සේවයේ යෙදීම සීමා කරන ලෙස දන්වා ඇතත් අමාත්‍යාංශ මඟින් අමතර නිවාඩු දින වැටුප් හා අතිකාල සේවය සඳහා නිතර ඉල්ලුම්පත් ඉදිරිපත් වීම සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව අත්‍යාවශ්‍යම හේතු මත පමණක් ආයතන ප්‍රධානියාගේ සීමාව තුල ලබා දිය හැකි නිවාඩු දින වැටුප් හා අතිකාල ලබා දෙන ලෙසත් ප්‍රධාන ලේකම් වෙත එම සීමාව ඉක්මවූ ඉල්ලුම්පත් යොමු කිරීම සඳහා කටයුතු නොකරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් සියලුම ලේකම්වරුන් වෙත අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 08. | හදිසි පිවිසුම් දොරටු අවහිර කිරීම සම්බන්ධව | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් හදිසි පිවිසුම් දොරටුව අවහිර වන සේ සභාපතිතුමාගේ කාමරය ස්ථාපිතකර ඇති බවත්, රක්ෂණ වන්දි ඉල්ලුම් කිරීමට අවශ්‍යතාවයක් මතුවුව හොත් මෙසේ අපරක්ෂාකාරී ලෙස පිවිසුම් දොරටු අවහිර කිරීම නිසා සිදුවන අලාභ හානි වලට වන්දි ලබා දීම රක්ෂණ ආයතන ප්‍රතික්ෂේප කරන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු පැහැදිලි කරන ලදී.<br><br>අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් මෙසේ කටයුතු කරන වාතාවරණයක් තුල යම් හෙයකින් ගොඩනැගිල්ල ගිනි ගැනීමක් හෝ යම් අලාභයක් සිදු වුවහොත් ඒ සඳහා ගෙවීම් නොකරන බවට රක්ෂණ සමාගම් විසින් දන්වා ඇති බවත්, එසේ යම් සිදුවීමක් සිදු වුවහොත් ඔබ විසින් මෙසේ කටයුතු කිරීම මත එහි සම්පූර්ණ වගකීම අධිකාරිය විසින් දැරිය යුතු බවත් , මිලියන ගණනක් වැයකර කරදියාන ප්‍රදේශයේ මේවන විටත් ගොඩනැගිල්ලක් ඉදිකර ඇති නමුත් ඉන් ප්‍රයෝජනයක් ලබා නොගැනීම මත එය අනර්ථ වියදමක් බවට පත්වන බවත් අවධාරණය කරමින් තම ආයතන කටයුතු 2022.07.01 දින සිට එම ස්ථානයේ සංවිධානගතකර සිදුකර ගැනීමට කටයුතු කරන ලෙස අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත ලිඛිතව දැනුම් දෙන ලෙසට ප්‍රධාන ලේකම් විසින් පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 09. | අවදානම් සහිත ද්‍රව්‍ය විදුලි සෝපානයේ රැගෙන යාම සම්බන්ධව | අවදානම් සහිත ද්‍රව්‍ය අනාරක්ෂිත ලෙස විදුලි සෝපානයේ රැගෙන යාම හා ගොඩනැගිල්ල තුලට රැගෙන ඒම සම්බන්ධව තොරතුරු වාර්තා වී ඇති බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කිරීමට සියලුම ලේකම්වරුන් දැනුවත් කිරීමට කටයුතු කලයුතු බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් දැනුවත් කරන ලදී.<br><br>ඒ අනුව මේ සම්බන්ධයෙන් සියලුම ආයතන ප්‍රධානීන් ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 10. | කණ්ඩායම් ප්‍රවාහනයේ පවතින ගැටළු සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ සුදුසුකම්ලත් නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීම පිණිස යොදවා ඇති කණ්ඩායම් ප්‍රවාහන සේවා සම්බන්ධව විවිධ ගැටළු ඇතිවී ඇති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>➢ එක් කාර්යාලයකට අයත් කණ්ඩායම් ප්‍රවාහනය සඳහා යොදවා ඇති වාහනයක අළුත් වැඩියාවක් / රියදුරු නිවාඩු ලබා ගැනීම වැනි අවස්ථාවල වෙනත් කාර්යාලයකින් වාහනයක් ලබා ගැනීම සඳහා සකස්කර ඇති ක්‍රමවේදය අනුව කටයුතු කිරීමේදී වෙනත් අමාත්‍යාංශ වලින් ප්‍රමාණවත් සහයෝගය නොලැබීම.<br>➢ කණ්ඩායම් ප්‍රවාහනය සඳහා යොදවා ඇති වාහන විවිධ හේතු මත තාවකාලිකව අත්හිටවන අවස්ථාවල ප්‍රධාන ලේකම් කාර්යාලයේ පාලන අංශය දැනුවත් නොකිරීම<br>➢ මේ වන විට කණ්ඩායම් ප්‍රවාහනය ලබා ගන්නා නිලධාරීන් බස්නාහිර පළාත් සභාවෙන් පිටත ආයතන වෙත ස්ථාන මාරුවීමේදී ඒ පිළිබඳව ප්‍රධාන ලේකම් කාර්යාලයේ පාලන අංශය දැනුවත් නොකිරීම තුල එම කණ්ඩායම් ප්‍රවාහනයට වෙනත් නිලධාරියෙකු ඇතුලත් කිරීමට අපහසු තත්ත්වයක් ඇති වීම.<br><br>ආදී ගැටළු පවතින බව දන්වා සිටින ලදී.<br>යම් හෙයකින් රාජ්‍ය වියදම් කළමනාකරණය මත මෙම ලබා දී ඇති පහසුකම් අත්හිටුවීමට සිදුවූවහොත් එයද කිරීමට සිදුවන බැවින් මෙවැනි තත්ත්ව ඇතිවීමට ඉඩ නොතබා ඇතිවන ගැටළු බාහිරට යොමු නොකර අභ්‍යන්තරිකව විසඳා ගැනීමට පියවර ගන්නා ලෙසත් ඉදිරියේදී මෙවැනි ගැටළු ඇති නොවීමට මෙම පහසුකම් ලබා ගන්නා නිලධාරීන් සහයෝගයෙන් කටයුතු කරන ලෙසට ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම ආයතන ප්‍රධානීන් |

| | | | |
|---|---|---|---|
| 11 | බස්නාහිර පළාත් සභාවේ වාහන සඳහා ඉන්ධන පිරවුම්හලක් ස්ථාපිත කිරීම | ඉන්ධන ලබා ගැනීමට මේ දිනවල පවතින තත්ත්වය අනුව බස්නාහිර පළාත් සභාවේ ආයතන වෙනුවෙන් ඉන්ධන නිකුත් කිරීම සඳහා ඉන්ධන පිරවුම්හලක් ස්ථාපිත කර ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව ප්‍රධාන ලේකම් විසින් කරුණු පෙන්වා දෙන ලදී.<br>ඒ සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලද අතර, මහරගම පොල්වත්ත ප්‍රදේශයේ පිහිටි ඉඩම ඒ සඳහා යෝග්‍ය බවටත් ඉන්ධන පිරවුම් හලක් ලබාගත හොත් එය විවිධ සේවා සමුපකාර සමිතියක් වෙත පැවරීම සුදුසු බවටත් සාකච්ඡා කරන ලදී.<br>බස්නාහිර පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සෞඛ්‍ය , අධ්‍යාපන වැනි අත්‍යාවශ්‍ය සේවාවන් ඉටු කරනු ලබන ආයතන වල සේවා අවශ්‍යතාවය හා පළාත් සභාව සතු වාහන ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඉන්ධන සපයා ගැනීම සඳහා වෙනම පිරවුම්හලක් තිබීමේ අවශ්‍යතාවය අවධාරණය කර අනුමැතිය ලබා ගැනීම හා ඉදිරි කටයුතු කිරීමට සාකච්ඡා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු/ මූලස්ථාන ඉංජිනේරු) |
| 12 | සංවර්ධන නිලධාරි අභ්‍යාසලාභී පත්වීම් ලබාදීම | අභ්‍යාසලාභී උපාධිධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් විසින් කරුණු විමසා සිටිය අතර ඒ අනුව මේ දක්වා සංවර්ධන නිලධාරීන් 4661ක් දෙනෙකු සඳහා පත්වීම් ලබා දී ඇති බවත්, 2022.05.24 දින සංවර්ධන නිලධාරීන් 230 ද, 2022.05.31 දින සංවර්ධන නිලධාරීන් 47 ද, නව පත්වීම් ලබා දීමට කටයුතු කරන බවත් සංවර්ධන නිලධාරීන් 18ක් සම්බන්ධව ආණ්ඩුකාරතුමා වෙත යොමුකර ඇති අතර, තවත් සංවර්ධන නිලධාරීන් 51ක් ගේ විස්තර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් යොමු කල යුතුව ඇති බවද, ඒ අනුව සංවර්ධන නිලධාරීන් 5007කට පත්වීම් ලබා දීමට නියමිත බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>එමෙන්ම මේ වන විට සංවර්ධන නිලධාරීන් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය ඉක්මවා ඇති බවට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පෙන්වා දුන් අතර, 2022.05.31 දිනට පත්වීම් සියල්ල ලබා දීමෙන් අනතුරුව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ලබා දී ඇති කාර්ය මණ්ඩල සඳහා තනතුරු අනුමත කිරීමට කටයුතු කරන බව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) ප්‍රකාශ කරන ලදී. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 13 | ආපන ශාලාව භාවිතා කිරීමට පිටත ආයතනවලට අවස්ථාව ලබා දීම සම්බන්ධව | පළාත් සභා ගොඩනැගිල්ලේ ආපනශාලාව භාවිතා කිරීම සඳහා පළාත් සභා ගොඩනැගිල්ලෙන් පිටත ආයතනවලට ද පහසුකම් සලසා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් වී ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ප්‍රකාශ කරන ලදී.<br>ආපන ශාලාවේ දැනට පවතින මිළ ගණන් අනුව එසේ කටයුතු කිරීම ප්‍රායෝගිකව සාර්ථක නොවන බව සාකච්ඡා කරන ලදී.<br>පළාත් සභා ගොඩනැගිල්ලට යම් යම් කටයුතු සඳහා පැමිණෙන පිරිස් ද මෙම ආපන ශාලාව භාවිතා කරන අතර, පිටත ආයතනවල නිලධාරීන් පැමිණෙන්නේ නම් ගැටළුවක් මතුනොවන බව සාකච්ඡා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 14. | වාරිමාර්ග අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු යොදවා ගැනීම සම්බන්ධව | කොන්ත්‍රාත් පදනම මත වාරිමාර්ග අධ්‍යක්ෂ තනතුරේ සේවය කරන ලද නිලධාරිනිය වයස අවුරුදු 67 සම්පූර්ණ බැවින් ඒ සඳහා සුදුසු නිලධාරියකු යොදවා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>මෙම තනතුර සඳහා I ශ්‍රේණියේ සුදුසු නිලධාරියකු සොයා බලන ලෙසත් නොඑසේ නම් විශ්‍රාමික නිලධාරියකු හෝ සොයා බලන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.